# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2047/7 - 2017 නොවැම්බර් මස 27 වැනි සඳුදා - 2017.11.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ 2017 අංක 15 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

2017.11.01 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2017. 11.14 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

***සබරගමුව පළාත් සභාවේ 2017 අංක 15 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය***

2017.06.27 වන දින සභා සම්මත කරන ලදුව 2017.11.14 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2017 අංක 15 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී. එස්. ආර්. එම්. විජයරාජ,<br>
සභා ලේකම්<br>
සබරගමුව පළාත් සභාව.

2017 නොවැම්බර් මස 22 වැනි දින.<br>
සබරගමුව පළාත් සභාවේ දී ය.

1A PG 3784 — 12 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සබරගමුව පළාත් සභාවේ 2017 අංක 15 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යංශය.

**2017 අංක 15 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය**

සබරගමුව පළාතේ ග්‍රාම සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය, ප්‍රජා නායකත්වය පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, ග්‍රාම සංවර්ධන කලාප පිහිටුවීම, ප්‍රාදේශීය බලමණ්ඩල පිහිටුවීම, දිස්ත්‍රික් බලමණ්ඩල හා පළාත් බලමණ්ඩලය පිහිටුවිම සහ පවත්වා ගෙන යාම අරභයා අවශ්‍ය විධි විධාන සැලැස්වීම ද, එයට සම්බන්ධව හෝ ආනුෂාංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම ද සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ , පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

2006 අංක 05 දරණ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය අවලංගු හා අහෝසි වන බව.

මෙම ප්‍රඥප්තිය පැනවීම මගින් මීට පෙර මෙම පළාත් සභාව විසින් පනවා ඇති 2006 අංක 05 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය මෙයින් අවලංගු හා අහෝසි වේ.

මෙම ප්‍රඥප්තිය

පුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. 2017 අංක 15 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

පරමාර්ථ හා කාර්යභාරය

2. (අ) පළාත් සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සහභාගීත්වයෙන් ආර්ථික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම, ලියාපදිංචිය, පවත්වාගෙන යාම හා අධීක්ෂණය කිරීම.

(ආ) ප්‍රජාව, ප්‍රජාව විසින්ම බල ගැන්වීමට සැලැස්වීම.

(ඇ) ප්‍රජා නායකත්වය පුහුණු කිරීම.

(ඈ) කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන හරහා ග්‍රාමීය කාන්තාවන්ගේ සහජ කුසලතාවයන් ඔප් නැංවීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය දියුණු කිරීම.

(ඉ) නව සංවර්ධන ප්‍රවණතාවයක් හා ග්‍රාමීය තරුණ කොටස් විපර්යකාරකයන් බවට පත් කිරීම.

(ඊ) පළාත් සභාවේ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත් කිරීම සහ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශ ඔස්සේ සමිති මෙහෙයවීමට උපදෙස් දීම.

(උ) දැහැමි සමාජයක් ගොඩනැගීම සඳහා සමිති බලගැන්විම.

(ඌ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මගින් දිස්ත්‍රික් මට්ටමින් හා පළාත් මට්ටමින් සමිති අතර කාර්යය සාධන තරඟ පවත්වා ග්‍රාම සංවර්ධන සමිතිවල අභිමානය වර්ධනය කිරීම.

(එ) සමස්ථයක් ලෙස ග්‍රාම සංවර්ධන සමිති බල ප්‍රදේශයේ ප්‍රජාවගේ වෘත්තීය කුසලතා වර්ධනය, මාර්ගෝපදේශනය, වෘත්තීය පුහුණුව ලබා දීම හා ස්වයං රැකියා ගැන්වීම.

සංවිධාන ව්‍යුහය

03. (අ) ග්‍රාම සංවර්ධන විෂයභාර ලේකම්වරයා, මෙම ප්‍රඥප්තිය පිළිබඳ ප්‍රධාන බලධාරියා විය යුතුය.

(ආ) අමාත්‍යාංශ ලේකම්වරයාට සහය විම පිණිස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන ශ්‍රේණියේ අධ්‍යක්ෂවරයෙක් සහ ග්‍රාම සංවර්ධන නිලධාරි සේවයේ ජ්‍යෙෂ්ඨත්වය අනුව දිස්ත්‍රික් දෙක සඳහා සහකාර අධ්‍යක්ෂකවරයෙකු ද පත් කළ යුතුය.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාට සහය විම පිණිස කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක දෙක සඳහා ජ්‍යෙෂ්ඨත්වය මත දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු පත් කළ යුතු අතර පළාත තුළ ව්‍යාපෘති සකස් කිරීම, මෙහෙයවීම හා පසුවිපරම් සඳහා ජ්‍යෙෂ්ඨත්වය මත මුලස්ථාන ග්‍රාම සංවර්ධන නිලධාරීවරයෙකු ද පත් කළ යුතු ය.

(ඈ) දිස්ත්‍රික් නිලධාරින්ට සහය වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් අයෙකු බැගින් ග්‍රාම සංවර්ධන නිලධාරින් පත් කළ යුතු ය.

(ඉ) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා මැහුම් උපදේශිකාවන් පත් කළ යුතුය.

04. (අ) මේ දක්වා පිහිටුවනු ලැබ ඇති සියලුම ග්‍රාම සංවර්ධන සමිති මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට මාස තුනක කාලයක් තුළ ප්‍රතිසංවිධානය වෙමින් පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නැවත ලියාපදිංචි විය යුතු ය. ග්‍රාම සංවර්ධන සමිති ප්‍රතිසංවිධාන

(ආ) ඉහත වගන්තිය අනුව එම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට නව ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම හා ලියාපදිංචි කිරීම නව ව්‍යවස්ථාව හා රීති අනුව සිදු කළ යුතුය.

(ඇ) ඉහත ග්‍රාම සංවර්ධන සමිතිවල අදළ වන ව්‍යවස්ථා මාලාව ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබිය යුතුය.

(ඈ) එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා අනිවාර්යයෙන් එක් ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බලමණ්ඩලයක් පිහිටුවිය යුතුය.

(ඉ) රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික් දෙක සඳහා දිස්ත්‍රික් බලමණ්ඩල දෙකක් පිහිටුවිය යුතු ය.

(ඊ) පළාත සඳහා පළාත් බලමණ්ඩලයක් පිහිටුවිය යුතු ය.

(උ) එක් එක් ප්‍රාදේශීය බලමණ්ඩලයක්, දිස්ත්‍රික් බලමණ්ඩලයක් හා පළාත් බලමණ්ඩලයක් සඳහා වෙන වෙනම අරමුදල් හා ගිණුම් පවත්වාගෙන යා යුතුය.

(ඌ) ප්‍රාදේශීය බලමණ්ඩලවල අරමුදල්, බලමණ්ඩල ව්‍යවස්ථාවට අනුකූලව සකස් විය යුතු ය.

05. (අ) සබරගමුව පළාත සඳහා අරමුදලක් පවත්වාගෙන යා යුතුය. එම අරමුදල පහත සඳහන් ප්‍රභවයන්ගෙන් සමන්විතය. අරමුදල්

(I) පළාත් සභා මගින් වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් වෙන්කර දෙනු ලැබිය හැකි ප්‍රතිපාදන

(II) රජය මගින් ලබා දිය හැකි විදේශීය ප්‍රදාන

(III) යම් පුද්ගලයෙකු හෝ ආයතන මගින් කරන පරිත්‍යාග.

(IV) ග්‍රාම සංවර්ධන සමිති විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත් මගින් උපයන ආදයමෙන් අය කරනු ලබන මුදල්

(V) ලොතරැයි, සංදර්ශන හෝ වෙනත් අනුමත ක්‍රම මගින් ලැබෙන මුදල්

(VI) සාමාජික මුදල්, කාර්යය සාධන ජයග්‍රහණ වලින් ලද මුදල් හා විශේෂ ප්‍රදන

(ආ) මෙම කාර්යය සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් හත්දෙනෙකුගෙන් යුතු අරමුදල් කමිටුවක් පත්කළ යුතුය. එම කමිටුවේ සාමාජිකයින් ලෙස,

(I) අමාත්‍යංශ ලේකම්

(II) ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂක

(III) පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ පරිදි සාමාජිකයින් දෙදෙනෙකුත් මුදල් විෂයභාර අමාත්‍යතුමා සහ අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශය පරිදි සාමාජිකයින් තුන් දෙනෙකුත් වශයෙන් සාමාජිකයින් පස්දෙනෙකු පත් කළ යුතුය. (මෙම පස්දෙනා රාජ්‍ය නිලධාරියෙකු හෝ විෂය පිළිබඳ දැනුම ඇති පුද්ගලයකු විය යුතුය )

(IV) ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නිල බලයෙන්ම කමිටුවේ සභාපති වේ.

(ඇ) ගණපූර්ණය අවම වශයෙන් තුන්දෙනෙකුවත් විය යුතු ය.

(ඇ) මෙම අරමුදල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වෙනි වගන්තිය ප්‍රකාර විගණනයට ලක්වේ.

06. (අ) ප්‍රජා නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආධාර කිරීම.

(ආ) ඒ ඒ වසරේ ඵලදායි ලෙස ප්‍රජා සහභාගිත්වයෙන් කරන ලද ව්‍යාපෘති සංවිධාන හා ප්‍රජා නායකයන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ඇගයීමට ලක් කිරීම හා ඒ වෙනුවෙන් සම්මාන තිළිණ හෝ ත්‍යාග මුදල් පිරිනැමීම.

(ඇ) කාලීන ලෙස සංවර්ධනයට ඉවහල් වන ක්ෂේත්‍ර හඳුන්වා දීම. ක්‍රියාත්මක කිරීම සහ සහාය වීම.

(ඈ) ආර්ථික, ආගමික, සාමාජීය හා සදාචාරාත්මක වර්ධනයෙහි ලා ඵලදායී ව්‍යාපෘති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීමට රුකුල් දීම.

අරමුදලේ කාර්යභාරය

07. (අ) ග්‍රාම සංවර්ධන සමිතිවල පැන නැගෙන ආරවුල් පිළිබඳව විසඳුම් හා තීරණ විෂයභාර ලේකම්වරයා විසින් ලබා දිය යුතුය.

(ආ) එම තීරණයෙන් සෑහිමකට පත් නොවන සංවිධානයකට හෝ පුද්ගලයෙකුට විෂය භාර අමාත්‍යවරයාට අභියාචනා කළ හැකිය. එම ආරවුල් පිළිබඳ අවසාන තීරණය විෂය භාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි විය යුතුය.

නියෝග හා නීති සම්පාදනය

08. මෙම ප්‍රඥප්තියේ අදළ වන කාර්යයන් සඳහා නියෝග, විෂය භාර අමාත්‍යවරයා විසින් පැනවිය හැකි අතර පළාත් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

09. (අ) ග්‍රාම සංවර්ධන සමිති සඳහා පළාත් සභා අරමුදලින් ඉදිකරනු ලැබූ සියලු ගොඩනැගිලි වල පූර්ණ අයිතිය සබරගමුව පළාත් සභාව සතු වන අතර භාරකාරත්වය පමණක් ලියාපදිංචි ග්‍රාම සංවර්ධන සමිතිවලට හිමි වේ.

(ආ) ග්‍රාම සංවර්ධන සමිති සතු අනෙකුත් චංචල හෝ නිශ්චල දේපල වලද පූර්ණ අයිතිය සබරගමුව පළාත් සභාව සතු වන අතර භාරකාරත්වය අදාල සමිතියට අයත් වේ.

(ඇ) ග්‍රාම සංවර්ධන සමිති සතු යම් නිශ්චල දේපලකට අයත් ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ස්ථාවර දේපලක් සම්බන්ධව කඩා ඉවත් කිරීම, අළුතින් සෑදීමට ව්‍යුහය වෙනස් කිරීම ආදී ඕනෑම කටයුත්තකදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ණ අනුමැතිය ලබා ගත යුතුය.

(ඈ) ග්‍රාම සංවර්ධන සමිති සතු යම් නිශ්චල දේපලක් හෝ චංචල දේපලක් ග්‍රාම සංවර්ධන සමිති කාර්යයන්ගෙන් පරිබාහිර කාර්යයකට අවශ්‍ය වූ අවස්ථාවක දී ලබා දිය හැකිය. ඒ සඳහා මුදල් අය කිරීම් හෝ නොකිරීම ග්‍රාම සංවර්ධන සමිතියේ මහා සභා තීරණයක් පරිදි කළ හැකි ය.

10. මෙම ප්‍රඥප්තියේ සිංහල. දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

12-322

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.